# හද රිදවන මතක සුවඳ සහ අන්ධ භක්තිය - 14

පසුගිය ලිපියෙන් චිත්‍රා මුදලිගේ කන්‍යා සහෝදරිය ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයට පිවිසුන ආකාරයත්, ඇය මට මුණ ගැසුන ආකාරයත් පැහැදිලි කළෙමි. රෝහිත මුණසිංහ සහෝදරයා විසින් චිත්‍රා සහෝදරිය ගැන ඉදිරිපත් කර තිබෙන කරුණු ගැන තවත් පැහැදිලි කිරීමක් මෙම ලිපියෙන් ඉදිරිපත් කරමි.

මා කලින් දක්වා තිබෙන ආකාරයට චිත්‍රා සොයුරිය තොටළඟ සහ මට්ටක්කුලියේ සම්ට් පුර සමාජ සේවා සහ ශුභ සාධන කටයුතු වල නිරතව සිටි කාලයේ දී ජනතා විමුක්ති පෙරමුණේ උතුරු කොළඹ ආසණ සංවිධායක සහ කොළඹ දිස්ත්‍රික් සංවර්ධන සභා මන්ත්‍රී වරයෙකු ව සිටි ගාමිණී ජයලත් සහෝදරයා සමග ද, පංචිකාවත්තේ පැල්පත් වැසියන් (slum and shanty dwellers) ගේ ප්‍රශ්ණවලට සහන ලබා දීමට කැප වී කටයුතු කරන කාලයේ දී ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙකු සහ කොළඹ දිස්ත්‍රික් සංවර්ධන සභා මන්ත්‍රී වරයෙකු ව සිටි සෑම් සමරසේකර සහෝදරයා සමග ද සම්බන්ධ වෙමින් කටයුතු කරමින් සිටියාය. සෑම් සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක කාලයේ සිටම එහි සාමාජිකයෙකු විය. ශ්‍රී ලංකාවේ නාවික හමුදාවේ කණිෂ්ඨ නිලධාරියෙකු (Petty Officer) වූ ඔහු ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන කටයුතු වලට සහ 1971 අරගලයට ද සම්බන්ධ වී කටයුතු කලේය. 1988-89 ධවල භීෂණය සමයේ දී මේජර් ජෙනරාල් ජානක පෙරේරා ගේ නායකත්වයෙන් පිහිටුවා තිබුණු paramilitary හමුදා කොටස් විසින් අත් අඩංගුවට ගෙන 'අතුරුදහන්' කිරීමට භාජනය වූ දස දහස් ගණන් වූ පිරිස් අතරට ගාමිණී ජයලත් සහෝදරයාත් සෑම් සමරසේකර සහෝදරයාත් ඇතුලත් වූ බව පෙනේ. 'අතුරුදහන්' කිරීමට භාජනය වන තෙක්ම සෑම් සමරසේකර සහෝදරයා රෝහණ සහෝදරයාගේ ඉතාමත් සමීපතම සහ විශ්වාසවන්ත සගයෙකු ව සිටියේය.

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයට වඩා සමීප වන්නට චිත්‍රා සොයුරියට බල පා තිබුණු කරුණු අතර රෝමානු කතෝලික පල්ලියේ නායකත්වය දැරූ ඇතැම් පැවිදි අයගේ ජේසුමය නොවන පෞද්ගලික සහ පොදු ජීවන රටාව ද, ඔවුන් අතර රටේ දුක් විඳිනු ලබන ජන කොටස් ගැන පැවතුන අයහපත් ආකල්ප ද, ඔවුන් එවැනි ආකල්ප පිළිබඳව කෙරුන විවේචන නොරිස්සීම ද, ඔවුන් ගෙන් ඇතැම් පැවිදි අය රජයේ තොරතුරු සේවාවන් සමඟ පැවති අයහපත් සම්බන්ධතා ද වූයේය.

1980 මුල භාගයේ මරදාන අවට සහ පංචිකාවත්තේ පැල්පත් වැසියන් ගේ ප්‍රශ්ණවලට සහන ලබා දීමට චිත්‍රා සොයුරිය කැප වී කටයුතු කරන කාලයේ ඇයට මුහුණ දෙන්නට සිදු වූ එක් සිද්ධියක් මෙහි සඳහන් කොට තැබීම පංචිකාවත්තේ පැල්පත් වැසියන් ගත කරන ජීවිත වල ස්වභාවය විදහා පෑමට සුදුසු වේ යයි කල්පනා කරන්නෙමි.

1959 දෙසැම්බර් මස දස වැනිදා එක්සත් ජාතීන්ගේ මහා මංඩලය විසින් අනුමත කර ගන්නා ලද අංක 1386 (XIV) දරන යෝජනාවේ පස් වැනි වගන්තියට අනුව දරුවා මුහුණ දී සිටින සාමාජයීය දුෂ්කරතාවයන්ට අනුව විශේෂ වූ ආකාරයේ අධ්‍යාපනයක් ලැබීමට එම දරුවාට අයිතියක් ඇත. ලංකාවද මෙම යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළේය. එක්සත් ජාතීන්ගේ යෝජනා ගැන සහ බටහිර රටවල වෙසෙමින් එහි පවතින සියළු දේ ගැන වෛරයෙන් පසුවන අයට මෙම යෝජනා අමතක කොට බද උහමේ දක්වා ඇති සමාජ









ජීවන පිළිවෙත් ගැන අවධානය යොමු කිරීම වුවද ප්‍රමාණවත් වේයයි කල්පනා කරමි.

පංචිකාවත්තේ පැල්පත් වැසියන් පදිංචිව සිටින ප්‍රදේශය අවට බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි පාසැල් බොහොමයක් දක්නට ලැබේ. එහෙත් මෙම පැල්පත් වල නිවැසි පවුල්වල දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහාවත් කිසිදු අවස්ථාවක් නොලැබේ. මෙම දරුවන් පාසැලට ඇතුල් කර ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලා රජයට ත්, එම ප්‍රදේශයේ පැවති බාරොන් ජයතිලක විද්‍යාලයටත් ලිඛිත ව දන්වා සිටි නමුත් මෙම ආයතන වල පිළිතුර වූයේ අවශ්‍ය නිළ ඇඳුම් (school uniforms) සහ පොත් පත් නොමැතිව මෙම දරුවන් පාසැල් වලට ඇතුළත් කළ නොහැකි බව යි. චිත්‍රා සොයුරියගේ මූලිකත්වයෙන් සමාජය සහ ආගමික කේන්ද්‍රය (Centre for Society and Religion) විසින් පංචිකාවත්තේ විසූ පැල්පත් වැසියන්ගේ සහභාගිත්වය සහ සහායද ඇතිව ඔවුන්ගේ දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා දීම සඳහා පාසැලක් ආරම්භ කිරීම ට තීරණය කරන ලද්දේ මේ අනුව ය.

මෙහි පළමුවන ඡායාරූපයෙන් දැක්වෙන්නේ පැල්පත් වැසියන් එකතු වී තම නිවාස අසල කුණු කසළ එකතු කල ස්ථානය පිරිසුදු කොට තම දූ දරුවන් වෙනුවෙන් පාසැලක් ලෙස පොල් අතු සෙවිළි කරන ලද මඩුවක් ගොඩ නැඟීමට කටයුතු කරන ලද ආකාරයයි. පංචිකාවත්තේ පැල්පත් වැසියන් පදිංචිව සිටින ප්‍රදේශයේම පවත්වා ගෙන යන ලද රජයේ පාසැලක් මෙම ඡායාරූපයේම දකින්නට හැකිය. ඈත ප්‍රදේශ වලින් පවා සිසුන් ඇතුලත් කර ගන්නා ලද මෙම පාසැලට පැල්පත් වැසියන් ගේ දරුවන් ප්‍රවේශ වීම වාරණය කොට තිබිණි. දෙවැනි ඡායාරූපයෙන් දැක්වෙන්නේ ඔවුන් විසින්ම සකස් කරන ලද කිරිබත් සංග්‍රහයකින් මෙම 'පැල්පත්' පාසැල විවෘත කරන ලද ආකාරය යි. චිත්‍රා සොයුරියද ඇතුළු තවත් පැවිදි කණ්ඩායමක් මෙම පාසැලේ උගැන්වීමේ යෙදුනි. එහෙත් ප්‍රදේශයේ බලවත් අයගේ මැදහත් වීම හේතුවෙන් එම දරුවන්ට මෙම පාසැලේ ඉගෙනුම ලැබිය හැකි වූයේ දින කිහිපයක් පමණකි.

පළමුවන ඡායාරූපයේ දකින්නට තිබෙන බාරොන් ජයතිලක විද්‍යාලයට මෙම දරුවන් ඇතුලත් කර ගැනීම සඳහා කටයුතු කරන්නට මෙම බලවතුන් මැදිහත් වූයේ නැත. ඔවුන් මැදහත් වූයේ මෙම 'පැල්පත්' පාසැල විනාශ කර දැමීම සඳහා යි. කොළඹ මහ නගර සභාව මෙම කටයුත්තට සහභාගි වූයේ ඉතාමත් කඩිසර ආකාරයෙකිනි. තෙවැනි ඡායාරූපයෙන් දැක්වෙන්නේ කොළඹ මහ නගර සභාවේ සේවකයන් විසින් එහි ඉගෙනුම ලැබූ දරුවන් ඉදිරියේ ම එම 'පැල්පත්' පාසැල පොළවට සමතලා කොට ගිනිබත් කර දමන ලද ආකාරය යි. ගිනිනෙන් දැවී ගිය 'පැල්පත්' පාසැල හතරවැනි ඡායාරූපයෙන් දැක්වේ. කොළඹ මහ නගර සභා සීමාව තුළ සිදු වෙමින් තිබුන අනේක විධ නීති විරෝධී ක්‍රියාවන් මැඩ ලන්නට මෙම බලවත් අය මැදහත් වූයේ නම් කොළඹ මහ නගර සභා ප්‍රදේශය ඒ වන විටත් 'පාරිශුද්ධ' ප්‍රදේශයක් කරන්නට ඉඩ ප්‍රස්ථාව තිබිණි.

රෝහිත සහෝදරයා විසින් පින්තාරු කර ඇති චිත්‍රයට අනුව "මියුරු හඬින් කතෝලික දේවස්ථානයේදී ගිතීකා ගැයූ කන්‍යා සොයුරියක්" වූ චිත්‍රා සහෝදරිය, මගේ "ළෙන්ගතු ආරාධනයක් නිසාවෙන් විමුක්ති ගී කණ්ඩායමේ ගී ගයන්නට" පැමිණ, ඇඳුම් මාරු කිරීමේ "දුෂ්කර ක්‍රියාව හා රඟපෑම හැමදාමත් කළ නොහැකි වූ තැන කන්‍යාරාමයෙන් අභිනිෂ්ක්‍රමණය කරන ලද" කෙනෙකි. මේ හේතුවෙන් "ඇය විමුක්ති ගී කණ්ඩායමේ නිත්‍ය ගායිකාවක වුවාය".

එහෙත් සැබෑ තත්වය වූයේ චිත්‍රා සොයුරිය විමුක්ති ගී කණ්ඩායමේ ගායිකාවක් වන්නට කළකට පෙර ජනතා විමුක්ති පෙරමුණේ එකල මධ්‍යම කාරක සභිකයෙක් විසින් පවත්වන ලද දේශපාලන පංති පෙළට සහභාගි වී සිටි බවය. ඉන් පසුව දේශපාලන මණ්ඩල සභිකයෙක් විසින් ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසයේ පළමු වැනි වරට ප්‍රසිද්ධ කතෝලික දේවස්ථාන භූමියක පවත්වන ලද අධ්‍යාපන කඳවුරකට සහභාගි වූ ඇය කොළඹින් පිට ප්‍රදේශවල දේශපාලන කටයුතු වල ක්‍රියාත්මක ව සහභාගි වූ බවය. සුනිලා අබේසේකර සහෝදරිය 'විමුක්ති ගී' ප්‍රසංගයෙන් ඉවත් වීමෙන් ඇති වූ හිඩැස පියවන්නට ජනතා විමුක්ති පෙරමුණේ ආරාධනය පරිදි ඇය විමුක්ති ගී ගායක කණ්ඩායම ට සම්බන්ධ වූ බව ය. ජනතා විමුක්ති පෙරමුණේ මෙවැනි කටයුත්තකට චිත්‍රා සොයුරිය සම්බන්ධ කර ගන්නා ලද්දේ අහම්බෙන් නොවන බව මෙයින් පැහැදිලි වෙයි. චිත්‍රා සොයුරිය පැවිදි ජීවිතයේ වගකීම් වලින් ඉල්ලා අස් වන්නට තීරණය කලේ ඇය විමුක්ති ගී කණ්ඩායම ට සම්බන්ධ වී තවත් කලක් ඉක්ම ගිය පසු ය.

චිත්‍රා සහෝදරිය ගැන රෝහිත මුණසිංහ සහෝදරයා ඉදිරිපත් කර තිබෙන ඇතැම් දේ සම්බන්ධයෙන් තව දුරටත් කරුණු පැහැදිලි කරන්නට මීළඟ ලිපියෙන් බලාපොරොත්තු වෙමි.

ලයනල් බෝපගේ




